**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**
**පුරප්පාඩු**

කැලණිය විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුර : විනයාරක්ෂක නිලධාරි (II ශ්‍රේණිය)**

**සුදුසුකම්**

1. I පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධරයෙකු වීම
   II වයස අවුරුදු 30- 45 අතර වීම
   III ශාරීරික යෝග්‍යතාවය පිරිමි උස : අඩි 5 අඟල් 5ට නොඅඩු විය යුතුය.
   පපුව : අඟල් 32 (සාමාන්‍ය)
   කාන්තා උස : අඩි 5 අඟල් 4ට නොඅඩු විය යුතුය.

**සටහන :** පොලිස් හෝ හමුදා සේවයේ පළපුරුද්දක් ලබා ඇති සහ ක්‍රීඩා කටයුතු සමාජ සුබසාධක ක්‍රියාකාරකම් සම්බන්ධව විශ්වවිද්‍යාල හා ජාතික මට්ටමේ ක්‍රියාකාරි සහභාගිත්වයක් ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

හෝ

2. ශ්‍රී ලංකා හමුදා සේවයන්හි මේජර් හෝ ඊට සමාන වන තනතුරක පළපුරුද්ද සහිත හෝ ශ්‍රී ලංකා පොලීසියේ හෝ ඒ හා සමාන තනතුරක පළපුරුද්ද තිබීම.

**තෝරාගැනීම** : සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**වැටුප් පරිමාණය** **UMN 3 (II) 42885 – 18x660 – 54765 p.m.**
(කොමිෂන් සභා චක්‍රලේඛ 17/2016 සහ 17/2016 (v) අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය)
මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

**02. තනතුර : ආරක්ෂක පරීක්ෂක (II ශ්‍රේණිය)**

**සුදුසුකම්**

1. අ: දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 05 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබිය යුතුය. එසේ සම්මාන සාමාර්ථ ලබාගත් විෂයයන් අතරට සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය යන විෂයන් ඇතුළත් විය යුතුය.

හෝ

ආ: තුන්වරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 කින් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව ඇත්තා වූ සහ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක

සේවකයින් විය යුතුය. සමත්ව ඇති විෂයයන්ට සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය යන විෂයන් ඇතුළත් විය යුතුය.

සහ

I. පොලිස් හෝ හමුදා සේවයේ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක ආරක්ෂක සේවයේ හෝ පිළිගත් ආරක්ෂක සේවා ආයතනයක ආරක්ෂක සේවයේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

II. ක්‍රීඩාවන්හි ක්‍රියාශීලී ලෙස සහභාගි වී තිබිය යුතුය.

III. උස : අඩි 5 අඟල් 4 කට නොඅඩු විය යුතුය.
පපුව : අඟල් 34 කට නොඅඩු විය යුතුය. (සාමාන්‍ය)

**තෝරා ගැනීම** : සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වැටුප් පරිමාණය : UMN 1 (IIIA) රු. 30725 -17x300 - 35825 (මාසික)**
(කොමිෂන් සභා චක්‍රලේඛ 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය)
මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

**03. තනතුර : පෙදරේරු (II ශ්‍රේණිය)**

**සුදුසුකම් :**

I. අටවන (08) ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය.

II. **(අ)** බිත්තිපාද, බිත්ති ආරුක්කු කේතුමය කණු, දුම් කවුළු කසළ කාණු කුහර ආදිය ඉදි කිරීමේදී උපයෝගී කර ගන්නා ගඩොල් වැඩ සහ නොයෙකුත් ආකාරයේ ක්‍රම.

**(ආ)** සියලුම අන්දමේ බදාමයන්, ශක්තිමත් කරන ලද කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම හා දැමීම.

**(ඇ)** සැලසුම් කියවීම හා සරළ ඉදි කිරීම් සඳහා අත්තිවාරම දැමීම.

**(ඈ)** එමල්ෂන් තීන්න පාවිච්චි කිරීම ඇතුළු තීන්ත ආලේප කිරීම පිළිබඳව දැනුමක් තිබිය යුතුය.

III. පෙදරේරු වැඩ පිළිබඳව වසර 02කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

**සේවා පළපුරුද්දට අදාළ සේවා සහතික වල පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ නොමැති අයදුම්පත් අදාළ සේවා පළපුරුද්ද නොමැති සේ සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**වයස :** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** - (U-PL 3 III) රු. 29915 - 16x 270 – 34235 (මාසික)
(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**තෝරා ගැනීම :** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

04. **තනතුර : විදුලි කාර්මික (II ශ්‍රේණිය)**

**සුදුසුකම් :**

**I.** කියවීමට හා ලිවීමට හැකියාව තිබීම.

**II.** පහත සඳහන් කරුණු පිළිබඳ දැනීම.

**(අ)** දෝෂයන් සොයා ගැනීම, ද්‍රව්‍ය අළුත් වැඩියා කිරීම සහ නැවත සවි කිරීම, ට්‍රාන්ස්ෆෝමර්සහ සියළු වර්ග වල යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ කේබල්, වයර්, කම්බි ඇදීමේ විවිධ ක්‍රම, බද්ධ කිරීම, මීටර් හා කුඩා ට්‍රාන්ස්ෆෝමර් පරීක්ෂා කිරීම.

**(ආ)** ඇඳීමේ සහ රූප සටහන් කියවා තේරුම් ගැනීම, පරිමාණයන් කියවීම සහ භාග වලින් මාන සටහන් තැබීමට ඇති හැකියාව.

**(ඇ)** මෙම වෘත්තියේදී ආයුධ භාවිතය හා ආරක්ෂාව පිළිබඳ දැනුම තිබීම.

**III.** රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක විදුලි කාර්මිකයකු වශයෙන් අවුරුදු දෙකකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

සටහන : **සේවා පළපුරුද්දට අදාල සේවා සහතික වල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ නොමැති අයදුම්පත් අදාල සේවා පළපුරුද්ද නොමැති සේ සළකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**වයස :** අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** - (U-PL 3 III) රු. 29915 - 16x 270 – 34235 (මාසික)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**තෝරා ගැනීම** : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

05. **තනතුර : කාර්මික (II ශ්‍රේණිය)**

**සුදුසුකම් :**

I. 08 වන ශ්‍රේණිය සමත් විය යුතුය.

II. පහත සඳහන් කරුණු පිළිබඳ දැනීම.

**(අ)** පරිමාණ, සූක්ෂම මාන කියවීම සහ භාග වලින් මාන සටහන් තැබීමට හැකියාව තිබීම.

**(ආ)** වාෂ්ප, මොටර් සහ ඩීසල් පිරියත හා යන්ත්‍රෝපකරණ වල විශේෂිත සවි කිරීම් වර්ග, ලියවන පට්ටල් හෝ මිල්ලම් කිරීමේ යන්ත්‍ර සහ හැඩ ගැමේ (Shaping) යන්ත්‍ර වැනි වැඩපල යන්ත්‍ර ක්‍රියා කරවීමට හැකියාවක් තිබීම.

**(ඇ)** ඇඳීම් (Drawing) කියවීම සහ අවබෝධය පිළිබඳව දැනුමක් තිබිය යුතුය.

III. කාර්මිකයෙකු හෝ යන්ත්‍ර ක්‍රියාකරුවෙකු ලෙස වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

**සටහන :** **සේවා පළපුරුද්දට අදාල සේවා සහතික වල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ නොමැති අයදුම්පත් අදාල සේවා පළපුරුද්ද නොමැති සේ සළකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**වයස :** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** - (U-PL 3 III) රු. 29915 - 16x 270 – 34235 (මාසික)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**තෝරා ගැනීම** : වෘත්තීය පරික්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**<u>අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය</u>**

ඉල්ලුම්පත් විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය. (**www.kln.ac.lk**) නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමග ඉල්ලුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර **2020 නොවැම්බර් මස** 2 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **සහකාර ලේඛකාධිකාරී/ආයතන අනධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් හට වයස් සීමාව බලනොපාන අතර ඔවුන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාල සතුය.

අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, අසම්පූර්ණ, අපැහැදිලි හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර එසේ ප්‍රතික්ෂේප කරනු ලැබූ අයදුම්පත් කිසිදු හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ.

**ලේඛකාධිකාරී**
**කැලණිය විශ්වවිද්‍යාලය.**
**2020.10.14**